# 14 දිරියෙන් යුතු මෙහෙවර

පාවුල්තුමාගේ දෙවන ධර්ම දූත ගමන තුළ සීලස් සමග නොපසුබට වීර්යයෙන් ක්‍රියා කළ ආකාරය ආදර්ශයට ගෙන දිරියෙන් යුතුව සේවයේ යෙදීම සඳහා යොමු වීම මෙම පාඩම මගින් අපේක්ෂිත ය.

ක්‍රියා 15:36-41, 16, 17 වන පරිච්ඡේද, ක්‍රියා 18:1-22

## දෙවන ධර්මදූත ගමන

කියවා බලමු.

**ක්‍රියා 15: 36-18:22**

මත ගැටුමක් (ක්‍රියා 15:36-41

පාවුල් ජොහාන් මාර්ක් ගෙන යාමට තදින් ම විරුද්ධ වීම. (පළමු ගමනේ දී පර්ගායේ දී ඔහු හැරී ගිය හෙයිනි.)

බාර්ණබස් තම ඥාති පුත්‍රයා ගමනට හවුල් කරවා ගැනීමට දැඩි මතයක සිටීම.


ප්‍රතිඵලය

**අපොස්තුළුවරු දෙදෙනා අතර දැඩි මත ගැටුම හේතුවෙන් දෙදෙනා වෙන් ව ධර්මදූත ගමන් දෙකක නියැලීම.**


බාර්ණබස් ජොහාන් මාක් සමග සයිප්‍රසයට ගිය බව සඳහන් වේ. (ක්‍රියා 15:39) මත ගැටුම් අබිබවා, තීරණ ගැනීමේ දී සේවයට හානියක් නොවන ආකාරයෙන් නොපසුබට වීර්යයෙන් ඒවා ක්‍රියාත්මක කිරීමට මෙම ධර්මදූත නායකයන්ට හැකියාව තිබිණි. ඔවුන් වෙන් වුවද පාවුල් බාර්ණබස් සහ ජොහාන් මාක් අතර සම්බන්ධතාව අඛණ්ඩ ව පැවතුණු බව පාවුල්තුමාගේ ලිපි මගින් පැහැදිලි වේ.(කොලොස්සි 4:10, 2 තිමෝති 4: 11)

## දෙවන ධර්මදූත ගමනට පාවුල් සමග එක්වූවෝ

සභාවේ මූලිකයකු වූ ජෙරුසලම් මන්ත්‍රණ සභාවේ තීරණය අඩංගු සංදේශය රැගෙන ගිය දිවැසිවර **සීලස්**. ලුස්ත්‍රාවේ හා ඉකොනියේ සහෝදරයන් අතර ප්‍රශංසාව ලැබූ, පාවුල්තුමා විසින් චර්මඡේදනය කරනු ලැබූ **තිමෝතියස්**. වෛද්‍යවරයකු වූ, ලූක් සුබ අස්න හා ක්‍රියා පොතේ කතුරවරයා වූ **ලූක්** යන තිදෙනා ය.



# පාවුල්තුමාගේ දෙවන ධර්මදූත ගමන




❊ **සිරියාවේ අන්තියෝකිය (ක්‍රියා 15: 36-40)**

මත ගැටුමෙන් පසුව පාවුල් සීලස් ද කැටුව ගමන ඇරඹීම.

❊ **සිරියාව හා සිලිසියාව (ක්‍රියා 15:41)**

පළමු ධර්මදූත ගමනේ ඇරඹූ සභාවන් ස්ථිර කරමින් ගමන් කිරීම.

❊ **දර්බය හා ලුස්ත්‍රාව (ක්‍රියා 16:2-3)**

තිමෝතියස් චර්මඡේදනය කිරීමෙන් පසු ඔහු ද කැටුව යාම.

ආසියාවේ වචනය දේශනා කිරීම තහනම් කරන ලදුව, මසිදෝනියාවට යන ලෙස ශුද්ධාත්මයාණන් ඔවුන්ට මග පෙන්වූ සේක.

❊ **ත්‍රෝවස (ක්‍රියා 16: 8-10)**

"මසිදෝනියට ඇවිත් අපිට ආධාර කරන්න" යැයි මසිදෝනියේ මනුෂ්‍යයකුගේ අයැදීම දර්ශනයකින් පාවුල් දුටුවේ ය .

❊ **පිලිප්පිය (ක්‍රියා 16: 11-40)**

ත්‍රෝවසෙන් නැව් නැඟී සමොත්‍රාසියට ද, නෙයාපොලිසියට ද යාත්‍රා කළ පාවුල් ඇතුළු පිරිස පිලිප්පි නගරයට පැමිණියහ. පිලිප්පියේ විදේශීක ජුදෙව් ජන සමූහයක් වාසය කළහ. සබත් දිනයේ යාච්ඤාව සඳහා ධර්මශාලා භාවිත නො කොට ඔවුහු ගං ඉවුරේ රැස්වූහ.

## පිලිප්පියේ දී පැමිණි අභියෝග

පිලිප්පි ගං ඉවුරේ දී පාවුල්තුමාට හමු වන බැතිමතුන් කාන්තාවන් ය. ඔවුන්ට දේව වචනය දේශනා කර ධර්මදූත මෙහෙය එහි අරඹන ලදි.

මෙහි දී එම කාන්තාවන් අතර සිටි, තියාතිරා නුවරින් පැමිණි ස්ත්‍රියක වන ලිදියා දම් පාට සායම් වෙළදාමේ යෙදුණු තැනැත්තියකි.ඇය දෙවියන් වහන්සේට නමස්කාර කළ කෙනෙකි.ඇය ද ඇයගේ ගෙයි වැසි සියලු දෙනා ද බෞතිස්මය ලැබූහ.ජුදෙව් සමාජය තුළ ස්ත්‍රීන්ට අවහිරයක් ව තිබූ ආගමික හා සංස්කෘතික පිළිවෙත් අභියෝගයට ලක් කරමින් ස්ත්‍රීන් මූලික වූ සභාවක් බිහි විය.

## වහල් තරුණිය

ගුප්ත දෑ හෙළි කළ ආත්මයක් ආවේශ වී පේන කීමෙන් සිය ස්වාමිවරුන්ට බොහෝ ලාභ හිමිකර දුන් වහල් තරුණියක් විය. ඇය පාවුල් හා සීලස්ගේ ක්‍රියාවන් හඳුනා ගනිමින් දින කිහිපයක් ම මොරගසමින් ඔවුන් පසුපස පැමිණියා ය. පාවුල් එම ආත්මයට කථාකොට ඇගෙන් පහව යන ලෙසට ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් අණ කරන ලදි. එකෙණෙහි ම එම ආත්මය ඇගෙන් පහවිය.

එම වහල් තරුණියගේ ස්වාමිවරුන් විසින් පාවුල් හා සීලස් වෙළඳාම් පොළට ඇදගෙන ගොස් ප්‍රධානින් ඉදිරියේ සිටුවා නඩුකාරයන් වෙතට ද ගෙන යන ලදී. මොවුන් නුවර කලඹන බවත් රෝමවරුන්ට පිළිපදින්නට බැරි නීති විරෝධි චාරිත්‍ර උගන්වන බවත් කියමින් චෝදනා කරන ලදී. නඩුකාරයින් ඔවුන්ගේ වස්ත්‍ර ඉරා කෝටුවලින් තලා හිරගෙදර දැමීමට අණ කරන ලදී. හිර ගෙදර දී පාද දඬු කඳන්වල සවි කිරීම වැනි වද හිංසා රැසකට ඔවුහු මුහුණ පෑහ.

ඒ සියල්ල ඉවසමින් පාවුල් හා සීලස් නොපසුබට වීර්යයෙන් ඒවාට මුහුණ දුන් අයුරු ක්‍රියා පොත පෙන්වා දෙයි.

## සිරගත වීමේ දඬුවමට ලක් වූ පාවුල් සහ සීලස්

මධ්‍යම රාත්‍රියේ දී ඔවුන් යාච්ඤා හා දෙවිඳුන්ට ගී ගැයීම නිසා සිරකරුවෝ ද ඔවුන්ට ඇහුම්කන් දී සිටියහ. හදිසියේ ඇති වූ පොළෝ කම්පාවෙන් සිරගෙයි අත්තිවාරම් සෙලවී සිරගෙයි දොරවල් ඇරී සියල්ලන්ගේ බැඳුම් ලිහිණි. සිරගෙයි මුලාදෑනියා අවදි ව සිය දිවි නසා ගැනීමට සැරසිණි.

පාවුල් විසින් සිරගෙයි මුලාදෑනියා දිරිමත් කරන ලදී. "ඔබට කිසි අනතුරක් කර නොගන්න. අපි සියල්ලෝ මෙහි ය."

සිරගෙයි මුලාදෑනියා : ගැලවීම ලබන පිණිස මා කුමක් කළ යුතු ද?

පාවුල් : "ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ අදහගන්න. එවිට ඔබ ගැලවෙන්නෙහි ය, ඔබ ද ඔබේ ගෙයි වැසි සියල්ලෝ ද ගැලවෙන්නාහ."

(ක්‍රියා 11: 30-31)

සිරගෙයි මුලාදැනියා සහ ඔහුගේ ගෙයි වැසි සියල්ලෝ ම දේව වචනය අසා බෞතීස්ම ස්නාපනය ලැබූහ. මෙම ප්‍රාතිහාර්යය තුළින් තව තවත් දිරිමත් වූ ඔවුහු අන් අය දිරිමත් කළහ.

රෝම පුරවැසිභාවය හිමි ව තිබියදීත්, නියමිත හා නිවැරදි විනිශ්චයකින් තොර ව පාවුල් හා සීලස් සිරගත කිරීමේ වරද ඔවුන් විසින් රෝම නිලධාරීන්ට පෙන්වා දුන්හ. මෙසේ නීතිය අයථා ලෙස භාවිත කළ නිලධාරීන්ට විරෝධය පළ කළ ඔවුහු සැබවින් ම සේවයේ දී අභියෝග ජය ගත් බව පැහැදිලි වේ.

### ❊ තෙසලෝනිකය හා බෙරියාව (ක්‍රියා 17:1-15)

තෙසලෝනිකයේ මෙන් ම බෙරියාවේ දී ද ධර්මශාලාවේ දේශනා කළහ. ඒ නිසා ග්‍රීක් ස්ත්‍රී පුරුෂ කිහිප දෙනෙක් ම ඇදහිල්ලට පැමිණියහ. එහෙත් එම ඇදහිලිවතුන් හා ධර්මදූත පිරිස ජුදෙව් පීඩනවලට මුහුණ දුන්හ. මෙහි ප්‍රතිඵලය වූයේ සුබ අස්න පතළ කිරීම සඳහා ඊ ළඟ නගරය වෙත පාවුල්ට යාමට අවස්ථාව ලැබීම යි.

සීලස් හා තිමෝතියස් පීඩන ඇතිවූ නුවරවල තව දුරටත් සේවය කරනු පිණිස නොපසුබට වීර්යයෙන් නැවතී සිටීම වැදගත් ය.

### ❊ ඇතන්ස් (ක්‍රියා 17: 16-34)

පාවුල්තුමාගේ මී ළඟ මධ්‍යස්ථානය වූයේ දර්ශනවාදය, අධ්‍යාපනය, සාහිත්‍යය, විද්‍යාව හා කලාවට ප්‍රසිද්ධ නගරයක් වූ ග්‍රීසියේ ඇතන්ස් නුවරයි.

### ඇතන්ස් නගරයේ ධර්මදූත සේවය

- ❊ ජුදෙව්වන්, භක්තිවන්තයන්, දිනපතා වෙළඳාම්පළේ හමුවූවන් සමග වාද කිරීම.
- ❊ තමා හොඳින් උගත් දේ පිළිබඳ ව අන් අය හා වාදකිරීමෙන් පසුබිම ගොඩනගා ගැනීම. (ක්‍රියා 17: 17-18)
- ❊ ඇතන්ස් නගරයේ ධර්මදූත සේවය ජුදෙව්වන්, භක්තිවන්තයන්, දිනපතා වෙළඳාම්පළේ හමුවූවන් සමග වාද කිරීම
- ❊ එපිකූරීය දාර්ශනිකයන් - (ජීවිතයේ මූලික අභිප්‍රාය සතුට හා සොම්නස සෙවීම බව විශ්වාස කළ අය.)
- ❊ ස්තෝයික දාර්ශනිකයන් - (ස්වභාව ධර්මය සමග සහයෝගයෙන් තර්කානුකූලව සිතමින් මනා සාමයකින් ජීවත් විය යුතු බව ප්‍රකාශ කළ අය.)
- ❊ අන් අයගේ මත වාදවලට ඉඩ හැරීම.(ක්‍රියා 17:18)
- ❊ අන් අය තුළ කුතුහලයක් ඇති කොට සිය දහම ප්‍රචාරය කිරීමට අවස්ථාව ලබා ගැනීම (ක්‍රියා 17:19-21)

ස්ථානය → අරියෝපගයේ ශාලාව වියත් ග්‍රීක දාර්ශනිකයන් එක්රැස් වන ප්‍රසිද්ධ රැස්වීම් ශාලාවකි.

ඒම නුවර බහු ආගමික පරිසරය තුළ අන් අයගේ විශ්වාසයන් අගය කිරිම (ක්‍රියා17:22)
පරිසරය තුළින් ම තම දේශනය ඉදිරිපත් කිරීම සඳහා කාරණය තෝරා ගැනීම
'නාඳුනන දෙවිඳුන්ටය යන පූජාසනය' 'යන්න තුළින් දේව පණිවුඩය දීම.

## ඇතන්ස්හි දේශනය සැකෙවින්

ආගමික පිරිසක් වන ඇතැන්ස් වැසියන්ගේ ආගමික බව ප්‍රයෝජනයට ගනිමින් තම දේශනය ආරම්භයේ දී දෙවියන් වහන්සේ පිළිබඳව දීර්ඝ වර්ණනයක යෙදීම. ඒ හරහා රූප නමස්කාරයේ පුහු බව දැක්වීම. (ක්‍රියා 17: 24-27)

ඇතැන්ස් වැසියන් භාවිත කරන සාහිත්‍යය තුළින් තම දෙසුම පෝෂණය කිරීම (ක්‍රියා 17: 28)
දෙවියන් වහන්සේගේ අසමසම දේවත්වය හා සර්ව බලධාරිත්වය ගැන ප්‍රකාශ කිරීම (ක්‍රියා 17: 29)
මනස්ථාපනය වීමේ අවශ්‍යතාව ධර්මිෂ්ඨ විනිශ්චය හා ජේසුස් වහන්සේගේ පුනරුජ්ජීවනය පිළිබඳ ඉදිරිපත් කිරීම (ක්‍රියා 17: 30-31)

විවිධ ප්‍රතිචාර සඳහා ඉඩ හැරීම (ක්‍රියා 17: 32)

ඇතැන්ස්හි දී ස්ථානෝචිත ප්‍රඥාවෙන් නොපසුබට වීර්යයෙන් ක්‍රියාකිරීමෙන් පාවුල් තුමා අත්පත් කරගත් දෘශ්‍යමාන ප්‍රතිඵල වන්නේ සමහර ඇතැන්ස් වැසියන් දෙවියන් වහන්සේ අදහා ගැනීමයි. (දියෝනිසියස්, දමරිස් ඉන් ප්‍රධාන වේ. (ක්‍රියා 17: 34)

## ✲ කොරින්තිය (ක්‍රියා 18:1-17)

ග්‍රීසියේ දේශපාලන හා වාණිජමය මධ්‍යස්ථානයෙකි කොරින්තිය. දුරාචාරයට ප්‍රසිද්ධ නගරයක් ලෙස එය හැඳින්වේ.

පාවුල්තුමා — කූඩාරම් කර්මාන්තය — අකිලා සහ ප්‍රිස්කිලා යුවල

පාවුල්තුමා: ජුදෙව් දරුවකු ලෙස පුහුණු වූ කර්මාන්තය කූඩාරම් තැනීම යි. ඔහු වර්ෂ 1, 1/2ක් කොරින්තියේ නැවතී සිටියේ ය. දර්ශනයක් මගින් දෙවියන් වහන්සේ එය ඔහුට දන්වන ලදී.(ක්‍රියා 18:9-10)

අකිලා සහ ප්‍රිස්කිලා යුවල: අකිලා පන්තස්හි උපන් ජුදෙව්වෙකි. මෑත දී කොරින්තියට පැමිණි යුවළකි. ක්ලෞදියස් සියලු ජුදෙව්වරුන්ට රෝමයෙන් අහක් ව යන්නට අණ කළ කාලයේ දී ඔවුහු කොරින්තියට පැමිණියහ. (ක්‍රියා 18:1-2)

දෙගොල්ලන්ම එකට එක්වී එම කර්මාන්තයේ නියැලීම තුළින් තම ආර්ථික අවශ්‍යතා සපුරාගත්හ.. (ක්‍රියා 18:3)

සබත් දිනවල ධර්මශාලාවෙහි වාද කරමින් ජුදෙව්වරුන් හා ග්‍රීක්වරුන් ඇදහිල්ලට පමුණුවාලීමට ක්‍රියා කළේ ය.

පාවුල්, සීලස් හා තිමෝතියස් සමග එක්ව ධර්මය දේශනා කිරීමෙහි ම නිරත විය. නොපසුබට වීර්යයෙන් සිය කර්මාන්තයෙහිත් යෙදුණේ ය.

ජුදෙව්වන් සුබ අස්න ප්‍රතික්ෂේප කළ අවස්ථාවල දී විජාතිකයන් වෙත ගොස් ධර්මය දේශනා කළේ ය.

තීතස් ජුස්තස්, ධර්මශාලා මුලාදෑනියා වූ ක්‍රිස්පස් හා ඔහුගේ පවුලේ අය ගායස් (1 කොරින්ති 1:14), ස්තේපන් පවුලේ අය (1 කොරින්ති 1:16) වැනි කිහිප දෙනෙක් වචනය අසා අදහාගත්හ.

ගලීයෝ අකයියාවේ අධිපතියා ව සිටිය දී ඔහු ඉදිරියට පාවුල් ගෙන එන ලදී. නමුත් පාවුල්ට දඬුවම් කිරීමට ගලියෝ එකඟ නොවුණි.

❊ **කෙන්ක්‍රෙයාව (ක්‍රියා 18:18)**

පාවුල් අකිලා ද ප්‍රිස්කිලා ද සමග සිරියාවට යන අතරතුර දී භාරයක් වී සිටි බැවින් කෙන්ක්‍රෙයාවට ගොස් එහි දී හිස මුඩු කර ගත්තේ ය.

එපීසයෙන් නැව් නැග → කායිසාරියට ගොඩ බැස → ජෙරුසලමට ගොස් සිරියාවේ අන්තියෝකිය බලා නැවත ගමන් කරන ලදී.

විවිධ අභියෝග ජය ගනිමින් ශුද්ධාත්ම දිරිය හා සවිය තුළ ස්ථානෝචිත ප්‍රඥාවෙන් පාවුල්, සීලස්, තිමෝතියස් හා ලූක් දෙවන ධර්මදූත චාරිකාව තුළ නොපසුබට වීර්යයෙන් ක්‍රියා කළ ආකාරය කිතුනුවන්ට ආදර්ශයකි.

**ක්‍රියාකාරකම්**

1. පාවුල් තුමාගේ දෙවන ගමන තුළ මුහුණ දුන් අභියෝග, ඒවා ජය ගත් අයුරු ,ඉන් අපට ලබා ගත හැකි ආදර්ශ යන මාතෘකා යටතේ වගුවක් පිළියෙල කරන්න.